# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය !
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 13
NUMBER 07

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

OCTOBER 10, 2010 ඔක්තෝබර් මාසය (බුද්ධ වර්ෂ 2554 වප් මාසය) http://www.lankaheritage.com/lankaviththi/


# නැටවෙන තාලෙට ගහ බෙර පදයා !

♦ සංජය විමලරත්න විසිනි

එක් ආකාරයකින් බලනවිට රඟමඬලට පැමිණි නැටුම් ශිල්පියාත්, දේශපාලන පිටියට බැසගත් දේශපාලකයාත් ඉටු කරනුයේ සමාන කාර්‍යයන්ය. නැට්ටුවා රංග පීඨයට පැමිණ වැයෙන බෙර පද තාලයට අනුව සිය නැටුම කරගෙන යයි. දක්ෂ නැටුම් ශිල්පීහු ප්‍රේක්ෂක මනදොළ පිරෙන ආකාරයට නැටුමේ යෙදෙමින් නරඹන්නන් කුල්මත් කරන අතරම ඉන් ඉමහත් ප්‍රීතියක් ද විඳිති. දක්ෂ දේශපාලකයාද ජනතාව අතරට පැමිණ ඔවුන්ගේ ඕනෑ එපාකම් ඉටුවන ආකාරයට සිය දේශපාලන කාර්‍යයේ යෙදෙමින් තෘප්තියක් ලබයි. සිය කාර්‍යයන් සාර්ථක ලෙස ඉටුකරලීමට නොහැකි වන නැටුම්කරුවෝ වේවා, දේශපාලකයෝ වේවා අදාල ක්ෂෙත්‍ර වෙතින් ගිලිහී, කාටත් අමතකව යති. එසේම නාට්‍ය ක්ෂෙත්‍රයේ කුසලතාව ප්‍රමුඛව නොබියව ප්‍රේක්ෂක ජනතාව ඉදිරියේ ශිල්ප දක්වන නැට්ටුවෝ චිරාත් කාලයක් ජනතාව ගෙන් පිදුම් ලබති. ඒ අයුරින්ම දේශපාලන ක්ෂෙත්‍රයේ ද නොබියව, අවංකව කටයුතු කරන දේශපාලකයෝ ද ජනතාව අතර පිළිගනු ලබමින් දශක ගණනාවක් වැජඹෙති. බහුමානයට පත්වෙති. ලොව හැම රටකම පාහේ වරින් වර මෙවන් අය බිහිව ජනතාවට සුබසෙත සළසනවා මෙන්ම විශිෂ්ඨ නායකයින් බවට පත්වනු පෙනෙන්නට ඇත. එමෙන්ම ඒ රටවල සමාජයන් නව අකාරයන්ට හසුරුවමින්, හැඩගස්වමින් ඒවායේ අනාගතය නව මං වලට යවා ගොඩනගන අති විශිෂ්ඨ නායකයෝද වරින්වර බිහිවෙති. සැබෑ රාජ්‍ය තාන්ත්‍රිකයන් ලෙස ජනතාව පුදන්නේ එවන් අයටය. සෑම යුගයකම වාගේ එවැනි නායකයෝ ලොව බිහිවෙති.

මේ ලිපියෙන් අදහස් කරනුයේ මෑත යුගයේ දැනට දශක කීපයකට පෙර රටවල් දෙකක එවන් කටයුතු ඉටුකළ නායකයින් දෙදෙනෙකු ගැන විමසා බලමින් අප රටේද දැනට සිදු වෙමින් පවතින වෙනස්කම් විමර්ශණය කර බැලීමයි.

මේ සඳහා මා තෝරාගත්තේ අප අසල්වැසි රටවල් දෙකක එනම් මැලේසියාවේ අගමැති වශයෙන් සිටි මහතීර් මොහොමඩ් සහ එසේම සිංගප්පූරුවේ අගමැතිව සිටි ලී ක්වාන් යූ යන මහත්වරුන්ය.

## මහතීර් මොහොමඩ්

මහතීර් බින් මොහොමඩ් නව මැලේසියාවේ නිර්මාතෘ වශයෙන් සැල කිය හැකිය. 1981දී මැලේසියා අගමැතිකමට පත්වූ මෙතුමා 2003 දී විශ්‍රාම යන තුරුම වර්ෂ 22 ක් නොකඩවා එම තනතුරේ කටුයතු කළේය. ඒ අතින් ආසියාවේ අති දීර්ඝ කාලයක් සේවය කළ දේශපාලනඥයායයි කිව හැකිය.

1925 දී මලයාවේ කේඩා (Kheda) නමැති ප්‍රදේශයේ සාමාන්‍ය එහෙත් ධනවත් පවුලක උපත ලැබූ ඔහු එකල සිංගප්පූරුවේ තිබුණු රජයේ වෛද්‍ය විද්‍යාලයේ රජයේ වෛද්‍යවරයෙකු වශයෙන් සේවය ඇරඹීය. පසුව ඔහුගේම පෞද්ගලික වෛද්‍ය ආයතනයක් පිහිටුවා කටයුතු කරන අතර දේශපාලනයට පිවිසියේය එකල ජාතික දේශපාලන ව්‍යාපාරය වූ එක්සත් මලයානු ජාතික සංගමයේ ( United Malay National Organisation) හි සාමාජිකයෙකු වශයෙන් කටයුතු කළේය.

එකල බ්‍රිතාන්‍ය අධිරාජ්‍යයේ යටත් විජිතයක් වූ මලයා සමූහාණ්ඩුව යටතේ අද මැලේසියාව හා සිංගප්පූරුව ආදී ප්‍රාන්ත රාශියම පැවතිණ. ( Federation of Malaya) පසුව නිදහස ලැබුව ද එවකට නව නිදහස ලද බොහෝ රටවල් සේම මෙයද අධිරාජ්‍ය ගැති ස්වභාවයේ පාලනය පැවති රටක් වීය. වැඩිම ජන කොට්ඨාශය වූයේ මැලේ ජාතිකයින්ය. වැඩි කොටස වූ නිසාම පාලකයින් වූයේ ඒ අයයි. ජන සංඛ්‍යාවෙන් අඩු වුවද සිංගප්පූරුව පිනැංග් ආදී වෙළඳ මධ්‍යස්ථාන වල වාණිජ කටයුතු කළ චීන ජාතිකයෝ ද ධන බලයෙන් එවන් ප්‍රබලයෝ වූහ. මේ දෙපිරිස අතරේ දේශපාලන කුලල් කා ගැනීම් විටින් විට වූයේය. 1969 දී මේවා කැරළි කෝලහල බවට උග්‍ර වූ පසු රජයේ මැදිහත් වීමෙන් සමථයකට පත්විය. නමුත් පාලකයින් අධිරාජ්‍යගැති ආකල්පයකින් කටයුතු

4 වන පිටුව බලන්න ➛



# පියෙකු නැතිවී...
# Crying for lost dad....

Before the tears, seven-year-old **Lee** watched the coffin of his dad, draped in a Union flag, pause for a minute's silence and placed two red roses on the hearse. Fiancée **Lynsey** and **Lee** were in Wootton Bassett, Wiltshire, after **Joseph's** body was flown to RAF Lyneham. The soldier from Greenock, Renfrewshire, of The Royal Scots Borderers, 1st Battalion The Royal Regiment of Scotland, also leaves son Jamie,two. Mum Lynsey Houston comforts weeping son Lee yesterday as his hero dad's coffin passes slowly by.

**Lance Corporal Joseph Pool, 26, died during a grenade attack in Afghanistan on Sunday.**

හත් හැවිරිදි ලී, ඈත සිට සිය පියාගේ දේහය රැගත් රථය පිරිස විසින් ඉදිරියට ගෙන එනු ලබනු බලා සිටියේ ය. පෙට්ටිය මත ඉංග්‍රීසි කොඩිය අතුරා තිබුණි. අන් සියල්ලන් සමග විනාඩියක නිහඬතාවකින් පසු කුඩා පුත්‍රයා තම අත වූ රෝස මල් දෙක පෙට්ටිය මත තැබුවේ ය. අනතුරුව ඔහු ඉකි ගසා හඬන්නට පටන්ගත්තේ ය. ලින්සී නම් යුවතිය ද, මෙම දරුවා ද මේ මියගිය රණවිරුවාගේ පෙම්වතිය සහ පුත්‍රයා වෙති. බ්‍රිතාන්‍ය හමුදාවේ ස්කොට්ලන්ත බලකායට අයත් ලාන්ස් කෝප්‍රල් ජෝසප් පූල් (26) ඇෆ්ගනිස්ථානයේ දී තලේබාන් බෝම්බ ප්‍රහාරයකින් සති තුනකට පෙර ජීවිතක්ෂයට පත් විය. දේහය ගුවනින් ඔහුගේ ගමට ස්කොලන්තයට ගෙනැවිත් තිබුණි. රණවිරුවාගේ දේහය රැගත් පෙට්ටිය තම දෑසින් ඉවත්ව යද්දී ශෝකයෙන් යුතු මව ලින්සී හඬා වැළපෙන පුත්‍රයා තුරුළු කරගෙන ඔහු සනසන්නට වෑයම්කළ අයුරුය ඉහත ඡායාරූපයෙන් දැක්වෙන්නේ.

*Photograph - Courtesy - Mirror newspaper - UK*

නැතිවුණු පියාණන් යුදබිමකදි එපිට
හරසර ඇතිව ඔහු ගෙන ආ දා ගමට
වාවනු බැරි දුකින් වැළපෙන පොඩි හිතට
නොදනිම් කුමක් කිව යුතු දැයි මම නුඹට

**For a doting dad lost in a far away battle ground**
**Who returned in a box amid pomp & trumpet sound**
**When your tender mind weeps in inconsolable way**
**I am really lost for words, don't know what to say !**

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*





විස්තර පිටු අංක 3